සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

15 S I

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :.................................... ක්‍රිස්තියානි ධර්මය - I කාලය: පැය 01යි.

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුතෙකු බිහි කරන්නී ය. ............................................ යන නම ඔහුට තබන්නීය. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,
1. මෙසියස් ය. 2. එමානුවෙල් ය. 3. ක්‍රිස්තුස් ය. 4. මෙසායා ය.

(2) අදමිටුකම නමැති අඳුරින් වැසී තිබුණු ජුදා සමාජයට ආලෝකයක් වූයේ,
1. ජේසුස් වහන්සේගේ මෙලොව පහළවීමයි
2. ස්නාවක ජොහාන්ගේ මෙලොව පහලවීමයි
3. ජේසුස් වහන්සේගේ කුරුසිපත්වීමයි.
4. ස්නාවක ජොහාන්ගේ මරණයයි.

(3) මලාකි දිවැසිවරයා පවසන පරිදි සමිඳුන්ට පෙරටුව ගොස් ජනතාවට දේව රාජ්‍යය පිළිගැනීමට මග පිළියෙළ කරන්නේ
1. මෝසෙස්තුමාය
2. එලියා දිවැසිවරයා ය.
3. ස්නාවක ජොහාන්තුමා ය.
4. පාවුල්තුමා ය.

(4) ජේසුස් වහන්සේගේ මෙහෙවර පිළිබඳව යෙසායා දිවැසිවරයා කළ අනාවැකිය සම්පූර්ණ වන්නේ උන් වහන්සේගේ
1. මෙලොව පහළවීමෙන් ය
2. පරීක්ෂාවන්ට මුහුණ දීමෙන් ය
3. ශ්‍රාවකයින් කැඳවීමෙන් ය.
4. නාසරෙත් දේශනයෙන් ය.

(5) ස්නාවක ජොහාන්තුමා මනස්ථාපනයේ බව්තීස්මය ලබාදෙමින් බොහෝ දෙනෙකු
1. ස්වාමීන් වහන්සේ වෙත හරවනු ලැබුවේ ය.
2. පාපායෙන් ගලවාගනු ලැබුවේ ය.
3. මනස්ථාපනය කළ සේක
4. තමන් වෙත කැඳවාගත් සේක

(6) ජේසුස් වහන්සේ සිදුකළ මෙහෙවරෙහි සියල්ල ඉටුවන්නේ
1. උන්වහන්සේගේ කැමැත්ත අනුව ය.
2. දෙවියන් වහන්සේගේ කැමත්තට අනකූලව ය.
3. දෙමව්පියන්ගේ කැමැත්තට අනුව ය.
4. රෝම අධිරාජ්‍යයාගේ සැලැස්මට අනුකූලව ය.

(7) ඔටුලෝම වස්ත්‍රයක් ඇඳ, ඉණ වටා හම් පටියක් බැඳ සිටියේ ය පළඟැටියන් හා වන මී ඔහුගේ ආහාරය විය මෙසේ සඳහන් වන්නේ,
1. එලියා දිවැසිවරයා ගැන ය.
2. මෝසෙස්තුමා ගැන ය.
3. ස්නාවක ජොහාන්තුමා ය.
4. ජේසුස් වහන්සේ ගැන ය.

(8) ජේසුස් වහන්සේගේ මෙහෙවර කවුරුන් උදෙසා ද යන්න සංකේතවත් කරමින් දේවදූතයන් උන්වහන්සේගේ උපත මුලින් ම දනුම් දෙන්නේ,
1. හෙරොද් රජතුමාට ය.
2. පරිසිවරුන්ට ය.
3. උත්තම පූජකයාට ය.
4. එඬේරුන්ට ය.

(9) ජේසු බිළිඳාට නම තබන අවස්ථාවේ ඉටුකළ අනෙක් චාරිත්‍රය වන්නේ,
1. බෞතීස්මය යි. 2. ඉඳුල්කට ගෑම යි 3. චර්මඡේදනය යි 4. කැප කිරීම යි.

(10) ඊශ්‍රායෙල් කුළුඳුල් පිරිමි දරුවන් විනාශ නොවී දේව රැකවරණ ය අත්දුටුවේ
1. මෝසෙස්ගේ කාලයේදී ය.
2. දාවිත් රජතුමාගේ කාලයේදී ය.
3. ආබ්‍රහම්තුමාගේ කාලයේදී ය.
4. ජෝසෙප්තුමාගේ කාලයේදී ය.

(11) සමාජය තුළ එකිනෙකා පෝෂණය කිරීම හා රැක ගැනීම උතුම් ගුණාංගයක් බව ස්නාවක ජොහාන්තුමා පෙන්වා දෙන්නේ එතුමා වෙත පැමිණි,
1. පොදු ජනතාවට ය.
2. රාජ්‍ය සේවයේ යෙදී සිටි අයට ය.
3. ආරක්ෂක අංශයට ය.
4. ජුදා ආමික ජනතාවට ය.

(12) ''එහෙත් මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් වන්නේ ය. එතුමන්ගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි'' ස්නාවක ජොහාන්තුමාගේ මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ එතුමන්,
1. තමා සුළු තැනැත්තෙකු ලෙස වටහාගෙන සිටි බව ය.
2. තම කාර්යභාරය හොඳින් හඳුනාගෙන සිටි බව ය.
3. තමා දුර්වල තැනැත්තෙකු බව වටහාගෙන සිටි බව ය.
4. තම සේවයේ වගකීම හඳුනාගෙන සිටි බව ය.

(13) හෙරෝද් රජු විසින් ස්නාවක ජොහාන්තුමා සිරගත කර මරණයට පත්කරනු ලබන්නේ එතුමා
1. හෙරොද්ගේ අණට අකීකරු වූ නිසා ය.
2. හෙරෝද්ගේ බලයට තර්ජනයක් වූ නිසා ය.
3. හෙරොද්ගේ පාලනයට විරුද්ධ වූ නිසා ය.
4. හෙරොද්ගේ දුෂ්ඨකම ගැන තරවටු කළ නිසා ය.

(14) ජේසුස් වහන්සේගේ මෙහෙවර ඇතුළත් පණිවිඩය යෙසායා දිවැසිවරයා මගින් දෙවියන් වහන්සේ ජුදෙව් ජනතාවට එළිදරව් කරන්නේ,
1. මිසරයේදී ය.
2. බබිලෝනියේදී ය.
3. නාසරෙත්හිදී ය.
4. ජෙරුසලමේදී ය.

(15) ජේසුස් වහන්සේ තමන් වහන්සේ ප්‍රතික්ෂේප කරනු ලැබූ දිවැසිවරයා ලෙස ජනතාවට දැනෙන්න සැලැස්වූ ප්‍රකාශය වන්නේ
1. වෙදතුමනි ඔබම සුවකර ගන්න යන්න ය.
2. නුඹ මා සෙව්වේ මන්ද යන්න ය.
3. නුඹ ගොස් පූජකයන් ඉදිරියේ පෙනී සිටින්න යන්න ය.
4. හිවලුන්ට බෙනද, පක්ෂීන්ට කැදලිද ඇත. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාට හිස තබන්නටවත් තැනක් නැත යන්නය.

(16) ජේසුස් වහන්සේගේ ජීවිතය හා සේවය සමග වැඩි සම්බන්ධතාවයක් දක්වන ස්ථානයක් වන්නේ,
1. නාසරෙත් ධර්මශාලාව ය.
2. හෙරොද් රජමාළිගාව ය.
3. තිබේරියස් විල ය.
4. ජෝර්දාන් ගඟ ය.

(17) ජේසුස් වහන්සේට කීකරුවීමෙන් උන්වහන්සේගේ බලය අත්දකින්නට හැකි බව අපට පෙන්වාදෙන සීමොන් පේදුරුගේ ප්‍රකාශය වන්නේ,
1. ස්වාමීනි මා වෙතින් ඉවත්වුව මැනව යන්නයි.
2. ඔබගේ වචනය නිසා දැල් හෙලමියි යන්නයි.
3. ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය යන්නයි.
4. ඔබ සමග මරණයට වුවත් යන්නට ලැස්තියි යන්නයි.

(18) දේව රාජ්‍යයේ වර්ධනයට කොටස්කරුවන් වීමට හැකි බව ජේසුස් වහන්සේ පෙන්වාදුන් සිදුවීම වන්නේ,
1. සීමොන්ගේ නැන්දනිය සුවකිරීමේ සිද්ධිය යි.
2. පව්කාර ස්ත්‍රියට සමාවදීමේ සිද්ධිය යි.
3. බෙතානියේ මාර්තා හා මරියාගේ සිද්ධිය යි
4. සමාරිය ස්ත්‍රිය මුණගැසීමේ සිද්ධිය යි.

(19) ජේසුස් වහන්සේ ණය කරුවන් දෙදෙනා පිළිබඳව උපමාව වදාළේ
1. සාකෙවුස්ගේ නිවසේ කෑමට හිඳගත් අවස්ථාවේ ය.
2. යායිරස්ගේ නිවසේදී දියණිය සුවපත් කළ අවස්ථාවේදී ය.
3. ලාසරුස්ගේ නිවසේදී මරියා ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට සවන්දෙන අවස්ථාවේ ය.
4. සීමොන්ගේ නිවසේදී පව්කාර ස්ත්‍රිය ජේසුස් වහන්සේගේ පාද ආලේප කළ අවස්ථාවේ ය.

(20) ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගේ දියණි ලෙස හඳුන්වනු ලැබුවේ,

1. 18 වසරක් කුදුව සිටි ස්ත්‍රිය ය.
2. මහලේ රෝගී ස්ත්‍රිය ය.
3. සමාරිය ස්ත්‍රිය ය.
4. පව්කාර ස්ත්‍රිය ය.

(21) ශුද්ධ දේශය තුළ රෝම පාලනය ප්‍රතික්ෂේප කළ ශ්‍රාවකයා වන්නේ,

1. යුදස් ය.
2. යුදස් ස්කාරියොත් ය.
3. සීමොන් ය.
4. සීමෝන් පේදුරු ය.

(22) ජේසුස් වහන්සේගේ කැමැත්ත ඇතිනම් එය සිදුවන බව විශ්වාස කිරීම → ජේසුස් වහන්සේ කැමැත්ත ප්‍රකාශ කරමින් ශරීරයට අත තැබීම → පවිත්‍රවීමේ පිළිවෙතට යොමු කිරීම → සුවය ලැබ සමාජයේ පිළිගැනීමට පාත්‍රවූයේ,

1. කුදු ස්ත්‍රිය
2. ලාදුරු රෝගියා ය.
3. අංශභාග රෝගියා ය.
4. කොරවූ තැනැත්තා ය.

(23) ''දේවාපහාසය කරන මේ මිනිසා කවුද?'' මෙසේ ප්‍රකාශ කළේ,

1. හෙරොද් ය.
2. පිලාත් ය.
3. නායක පූජක හා ශතාධිපතියා ය
4. පරිසිවරුන් හා විනයධරයන් ය.

(24) පොළවේ පව්කමා කරන්න මනුෂ්‍ය පුත්‍රයාට බලය ඇතිබව සියල්ලන් දැනගන්නා පිණිස ජේසුස් වහන්සේ විසින් සුවකරනු ලැබුවේ,

1. ජාති අන්ධයා ය.
2. ලාදුරු රෝගියා ය.
3. අංශභාග රෝගියා ය.
4. වියළි අතක් ඇති මනුෂ්‍යයා ය.

(25) ප්‍රේමයෙන් තොරව ආගමික පිළිවෙත් කෙරෙහි පමණක් ගැතිවීමේ නිසරුකම ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,

1. ආගමික නීති අකුරට ම පිළිගත යුතුබව අවධාරණය කරමින් ය.
2. දන්දීමේ වැදගත්කම අවධාරණය කරමින් ය.
3. බාහිර දෝවනය වැනි ක්‍රියා වැදගත් බව අවධාරණය කරමින් ය.
4. ඉහත කිසිවක් තුළින් නොවන බව අවධාරණය කරමින් ය.

(26) ඔබ මේ දේවල් කරන්නේ කුමන අධිකාරී බලයකින් ද? යනුවෙන් ජේසුස් වහන්සේගෙන් ප්‍රශ්න කළේ,

1. දේව මාලිගාව පවිත්‍ර කිරීමේ කාර්ය නිම කිරීමෙන් අනතුරුව ය.
2. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේදී ය.
3. ජේසුස් වහන්සේ පිලාත් ඉදිරියට ගෙන යනු ලැබ සිටියදී ය.
4. ජේසුස් වහන්සේ හෙරොද් ඉදිරියේ සිටින විටදී ය.

(27) මිදිවත්ත හා ගොවින් පිළිබඳ උපමාව තමන්ට විරුද්ධව එල්ල කළ බව වටහාගත් නායක පූජකයන් හා විනයධරයන් උන්වහන්සේ අල්ලා ගන්නට සෙවූ නමුත් පසුබට වූයේ,

1. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව දැනගත් නිසා ය.
2. සෙනග ජේසුස් වහන්සේ ගැන ප්‍රසන්නව සිටිනිසා ය.
3. ජනතාව ප්‍රකෝප වී කලහාකාරී ලෙස හැසිරේයයි බියට පත් වූ නිසා ය.
4. දේව පුත්‍රයාට දඬුවම් දිය නොහැකි නිසා ය.

(28) ''දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේට ම දීම'' යනුවෙන් අර්ථ ගැන්වෙන්නේ,

1. ලෞකික රාජ්‍ය අතහැර දේව රාජ්‍ය අත්පත් කරගත යුතුය යන්න ය.
2. දෙවියන් වහන්සේට අයිති දේ අපට අයිති නැති බව ය.
3. දෙවියන් වහන්සේ අපට අයිති දේ අපෙන් බලාපොරොත්තුවන බවයි.
4. අපගේ මුළු ජීවිතයෙන් ම උන්වහන්සේට සේවය කිරීම කළ යුතු බවය.

(29) පුනර්ජීවනය දෙවියන් වහන්සේගේ වරමකි. එය ලබන අය සමාන වන්නේ

1. ස්වර්ගික රජ්ජුරුවන්ට ය.
2. දේව රාජ්‍යයේ පුත්‍රයන්ට ය.
3. දේවදූතයන්ට ය.
4. සදාකාලික ජීවනය අත්කර ගත් ශුද්ධවන්තයන්ට ය.

(30) කිතුණු දිවියට යාච්ඤාව ප්‍රබල ශක්තියකි., ජේසුස් වහන්සේ ද යාච්ඤාව තුළින් සවිමත් වූ බව පෙන්වා දීමට උචිත අවස්ථාව වන්නේ,
1. ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණන් යනුවෙන් යාච්ඤා කරන ලෙස පැවසූ අවස්ථාව ය.
2. ගෙත්සෙමන උයනේ සිදු කළ යාච්ඤාව හා සම්බන්ධ අවස්ථාව ය.
3. ඇතුල්ගෙට වැද යාච්ඤා කරන්න යනුවෙන් ප්‍රකාශ කළ අවස්ථාව ය.
4. පාලුකරයේදී යක්ෂයාට අවනත නොවූ අවස්ථාව ය.

(31) ජේසුස් වහන්සේගේ ආශ්චර්යයන් දකිනු රිසියෙන් උන්වහන්සේ දැක බොහෝ සතුටට පත් වූයේ,
1. පිලාත් ය 2. පූජකවරු ය. 3. විනයධරයෝ ය. 4. හෙරොද් ය.

(32) ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කර ජාතිවාදී කැරලිකරුවෙකු හා මිනීමරුවෙකු වූ බරබ්බස්ව තෝරා ගැනීම තුළින් පැහැදිලි වන්නේ
1. ජේසුස් වහන්සේට වඩා බරබ්බස් අහිංසකයෙක් යැයි සිතූ නිසා ය.
2. ජේසුස් වහන්සේ ජාතියට කැරලි ගැසුවේ යැයි සිතූ නිසා ය.
3. ජේසුස් තමන් එනම් ක්‍රිස්තුස් නම් රජෙක්යැයි ප්‍රකාශ කළ නිසා ය.
4. දේව රාජ්‍ය තුළින් ලද හැකි විමුක්තිය ඔවුන් ප්‍රතික්ෂේප කිරීම ය.

(33) ''පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි'' යනුවෙන් ප්‍රකාශ කළ අවසාන වචනයෙන් පැහැදිලි වන්නේ,
1. ජේසුස් වහන්සේ මරණය දක්වාම තම පියාණන්ට අවනත වූ බවයි.
2. ජේසුස් වහන්සේ තම පියාට ආදරේ බවයි.
3. පියාණන්ට භාරවීම සිරිතක් වූ බවයි.
4. ජේසුස් වහන්සේ තමපියාට භාර වූ බවයි.

(34) අප නොසිතන මොහොතක දේව රාජ්‍යයේ මෙහෙවරට දායක වීමට ඇරයුම් ලැබිය හැකිය. එසේ දායකවූ අයෙක් වන්නේ,
1. බරබ්බස් ය. 2. අරිමාතියේ ජෝසෙප් ය.
3. සිරේනියේ සීමොන් ය. 4. ලාසරස් ය.

(35) ජීවිතයේ අවසන් මොහොතේ වුවද තම වරද පිළිගෙන පසුතැවිලි වී කමාව ලබන්නා,
1. පව් සමාව ලබාගනි යි. 2. දේව පුත්‍රකම ලබයි.
3. සදාතනික ජීවනය උරුමකර ගනියි. 4. වරද පිළිගනියි.

(36) ජේසුස්වහන්සේගේ උත්ථාන වීමේ පුවත විමසා බලා තහවුරු කර ගැනීමේ අරමුණින් සොහොන වෙත ගියේ,
1. ජොහාන් ය. 2. පේදුරු ය. 3. සාවුල් ය. 4. මත්තියස් ය.

(37) සැකය වියවුල තුළ ගමන් ගත් ශ්‍රාවකයින් දෙදෙනා ජීවමාන ජේසුස් වහන්සේ සියසින් දැක ඇදහිල්ලෙන් ක්‍රියා කළහ. එම ගෝලයින් වන්නේ,
1. සීමොන් ජේත්‍රුස් හා ජාකොබ් ය. 2. පේදුරු හා තවත් ගෝලයකි.
3. පිලිප් හා යොහාන් ය. 4. ක්ලෙයෝපස් හා තවත් ගෝලයන් ය.

(38) ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් ඉදිරියේ ආහාර පවා වැළඳීමෙන්,
1. පුනර්ජීවනයේ සත්‍ය ප්‍රත්‍යක්ෂ කළේ ය. 2. ප්‍රාතිහාර්යාත්මක බලය ප්‍රත්‍යක්ෂ කළේය.
3. සමාදානය ප්‍රකාශ කළේ ය. 4. දේව බලය ප්‍රත්‍යක්ෂ කළේ ය.

(39) ජලය අපගේ බාහිර ජීවිතය පවිත්‍ර කරයි. අපගේ අභ්‍යන්තරය පවිත්‍ර කරනු බලන්නේ,
1. ගින්නෙන් ය. 2. ලෙයින් ය. 3. ශුද්ධාත්මයාණන් ය. 4. සදාතන ජීවිතයෙන් ය.

(40) ''නුඹේ දෙවි වන ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න'' මෙමගින් කිතුණු අපට දෙන පණිවිඩය වන්නේ,
1. ධනය බලයට නමස්කාර නොකිරීම ය.
2. දේව බලයට යටත්වන ලෙස ය.
3. එකම දෙවියන්ට පමණක් යටත් වන්න යන්න ය.
4. දෙවි වූ ස්වාමීන් වහන්සේට පමණක් එකම සිතකින් යුක්තව නමස්කාර කිරීමට කීකරුව බැහැපත් වීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

15 S II

# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය :........................................ ක්‍රිස්තියානි ධර්මය - II කාලය: පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) ''බලන්න මම ස්වාමින්ගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසටම ඉටුවේවා'' මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට කියන ලද්දක්ද?

(ii) මතෙව් සුභසත්නට අනුව ජේසු උපතෙහි විශේෂත්වය සංකේතවත් කරන සංකේත ලියා දක්වන්න.

(iii) ව්‍යවස්ථාව තම වාසියට අර්ථකතනය කරමින් ජනතාව දැඩි පීඩනයට ලක් කළ ආගමික කණ්ඩායම් 2 නම් කරන්න.

(iv) ජුදෙව්වන් දේව නමස්කාරය හා ආගමික කටයුතු සඳහා එක්රැස් වූ ස්ථාන 2 නම් කරන්න.

(v) ධර්ම දූතයින් සැත්තෑ දෙනා පිටත් කිරීමේදී දෙදෙනා බැගින් යැවීමෙන් බලපොරොත්තු වූ අරමුණු 2 ක් ලියන්න.

(vi) තිබේරියස් විල අසල ජේසුස් වහන්සේ කල සුවිශේෂී කාර්යන් 2 ක් ලියන්න.

(vii) ජේසුස් වහන්සේ රාජතේජසින් ජෙරුසලම් දේවමාලිගයට පිවිස එහි සිටි වෙළෙඳුන් පලවාහරිමින් කළ ප්‍රකාශ 2 ක් ලියන්න.

(viii) ජුදෙව් ජනතාව භාවිතා කළ බදු වර්ග 2ක් නම් කරන්න.

(ix) යමෙක් ඔබ අතරින් ශ්‍රේෂ්ඨතම තැනැත්තා වීමට නම් ඔහු තුළ තිබිය යුතු යැයි ජේසුස් වහන්සේ පෙන්වා දෙන ලක්ෂණ 2 ක් ලියන්න.

(x) වෛරය පිරුණු තැනට ......... අසමගිය ඇති තැනට .......... ගෙනයාමට වරදුන මැනව. අසීසයේ ෆැන්සිස් තුමාගේ යැදුම අනුව හිස්තැන් පුරවන්න.

(ලකුණු $2 \times 10 = 20$)

(2) (i) ජේසුස් වහන්සේ වෙනුවෙන් දෙමාපියන් ඉටු කළ චාරිත්‍ර 2 ක් ලියන්න. (ල. 02)

(ii) ජුදෙව් ජන සමාජයේ පැවති මංගල්‍ය 3 ක් නම්කර ඒවායේ ආරම්භක පසුබිම වෙන් වෙන්ව කෙටියෙන් ලියන්න. (ල. 03)

(iii) වත්මන් කිතුණු දේවස්ථානවල පවත්වන මංගල්‍ය නම් කර ඒවා දේව ගෞරවය සඳහා සිදුකළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(3) (i) ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ සේවය පිළිබඳ එළිදරව් කරනු ලැබුවේ කුමන ස්ථානයේදී ද? (ල. 02)

(ii) එම ප්‍රකාශය අනුව උන්වහන්සේගෙන් සේවය ලබන කොට්ඨාස 3 ක් නම් කර ඔවුන් ලබන සේවාවන් 1 බැගින් ඊට ඉදිරියෙන් ලියන්න. (ල. 03)

(iii) වත්මන් සමාජය තුළ කොන්වීමට ලක් වූවන් කවුරුන්දැයි සඳහන් කර කිතුණු දරුවන් ලෙස ඔවුන් වෙනුවෙන් ඔබ ක්‍රියා කරන ආකාරය කෙටියෙන් ලියා දක්වන්න. (ල. 05)

(4) (i) ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන් ප්‍රායෝගිකව පුහුණු කළ අවස්ථා 2 ක් ලියන්න. (ල. 02)

(ii) ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් ලැබූ පුහුණුව ප්‍රායෝගිකව ඉටු කළ අවස්ථා අතරින් උදාහරණ 3 ක් ලියන්න. (ල. 03)

(iii) කිතුණු දරුවෙක් ලෙස ඔබ ඔබේ ශ්‍රාවකත්වය සමාජය තුළ ප්‍රායෝගික කරන ආකාර 5 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(5) (i) පව්කාර ස්ත්‍රියට කමාව දීම තුළින් ජේසුස් වහන්සේ අභියෝගයට ලක්කළ ජුදෙව් ආකල්පය කුමක් ද?(ල. 02)

(ii) කොන්දේසි රහිත කමාව ලැබීමේ භාග්‍ය උදාකර ගැනීමට මෙම ස්ත්‍රිය එම අවස්ථාවේ ක්‍රියා කළ ආකාර 3 ක් ලියා දක්වන්න. (ල. 03)

(iii) කමාවෙන් ලැබෙන නිදහස අත්කර ගැනීමට අප කටයුතු කළ යුත්තේ කෙසේදැයි කරුණු 5 ක් ඔස්සේ කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

(6) (i) ජේසුස් වහන්සේ සබත් දිනදී සුවකළ රෝගීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 02)

(ii) සබත් දිනයේදී එම සුවකිරීම් පිළිබඳ විරුද්ධ වූ අයගෙන් ජේසුස් වහන්සේ අසන ලද ප්‍රශ්න මොනවාද? (ල. 03)

(iii) කිතුණු දිවියේ යහපැවැත්ම ඇතිකර ගැනීම උදෙසා ජේසුස් වහන්සේ හා ඵරිසි විනයධරයන් අතර පැවති සංවාදවලින් අප ජීවිතවලට එකතුකරගත හැකි ගුණාංග 5 ක් ලියන්න. (ල. 05)

(7) පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) දිවැසිවර කාර්යය

(ii) දේව සැලැස්මට අවනත වීම

(iii) ස්නාවක ජොහාන් තුමාගේ පෙරමග දූත සේවය

(iv) පේදුරුගේ ශ්‍රාවකත්ව ය.

(ල. 5 + 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

..... S I II

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

## ක්‍රිස්තියානි ධර්මය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 1 | 21 | 3 | 31 | 4 |
| 2 | 1 | 12 | 3 | 22 | 2 | 32 | 4 |
| 3 | 3 | 13 | 4 | 23 | 4 | 33 | 1 |
| 4 | 4 | 14 | 2 | 24 | 3 | 34 | 3 |
| 5 | 1 | 15 | 1 | 25 | 2 | 35 | 3 |
| 6 | 2 | 16 | 3 | 26 | 1 | 36 | 2 |
| 7 | 3 | 17 | 2 | 27 | 2 | 37 | 4 |
| 8 | 4 | 18 | 3 | 28 | 4 | 38 | 1 |
| 9 | 3 | 19 | 4 | 29 | 3 | 39 | 3 |
| 10 | 1 | 20 | 1 | 30 | 2 | 40 | 4 |

(ලකුණු 40 යි)

## II පත්‍රය

(1) (i) මරියතුමිය විසින් ගාබ්‍රියල් දේවදූතයාට

(ii) අහසේ පායන ලද තාරකාව / පෙරදිගින් පැමිණි ශාස්ත්‍රවන්තයන් / ඔවුන් පුදන ලද රන්, තුවරලා,, ගන්ධරස

(iii) පරිසිවරු හා සද්දුසිවරු

(iv) ජෙරුසලම් දේවමාලිගය / සිනගෝගය

(v) සාමුහිකව හා සහෝදරත්වයෙන් සේවය කිරීම

(vi) දේශනා කිරීම / මුල්ගෝලයන් කැඳවීම

(vii) මාගේ ගෘහය යාච්ඥාවේ ගෘහයකි / ඔබ එය සොරුන්ගේ ගෘහයක් කර තිබේ.

(viii) රෝම අධිරාජ්‍යයට බදු ගෙවීම / දේවමාලිගා බද්ද

(ix) මෘදුකම / යටහත්පහත්කම / අවංකකම / නපුරු නොමැති වීම / පලිනොගැනීම / වරද පිළිගැනීම / නිහතමානිකම / ඇදහිල්ල / විශ්වාසය

(x) ප්‍රේමය / ශාන්තිය (2 × 10 = 20)

(2) (i) චර්මච්ඡේදනය / නම් තැබීම / කැප කිරීම / අවු : 12 දේව මාලිගයට යාම

(ii) පාස්කුව - මිසරයේ වහල් බැම්මෙන් නිදහස ලබා නික්මයාම

පෙන්තකොස්ත - අලුත් අසවැන්න පිදීම

කූඩාරම් - පාලුකරයෙන් නික්මයාම

(iii) දේවස්ථාන මංගල්‍ය / පාස්කු මංගල්‍ය / නත්තල් මංගල්‍ය / විවාහ මංගල්‍ය / විවාහ සංවත්සර මංගල්‍ය

ඉහත මංගල්‍ය දේව ගෞරවය ඇතිවන ආකාරයටම මංගල්‍ය පැවැත්වීම පිළිබඳ ඉදිරිපත්කර ඇති කරුණු අනුව ලකුණු දෙන්න. (ල. 2 + 3 + 5 = 10)

(3) (i) නාසරෙත් සිනගෝගයේදී

(ii) දිළිඳුන් - සුභාරංචිය දේශනා කිරීම

වහලුන් - මිදීම ලැබෙන බව දැන්වීම

අන්ධයන් - පෙනීම ලැබෙන බව දැන්වීම

පීඩිතයන් - මුදවාලීම

(iii) සිසුන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න.

(ල. 2 + 3 + 5 = 10)

(4) (i) ගෝලයන් 12 / සැත්තෑ දෙනා

(ii) ගෝලයන් විසින් කර ඇති සියලුම සුවකිරීම / සුභ අස්ත දේශනා කිරීම් / සාමය පැතීම් / යාච්ඤා කිරීම් (සුව කිරීම් පමණක්ම ලියා ඇතත් ලකුණු දෙන්න)

(iii) * දයා සේවාවන් / දේව වචනය තේරුම් කිරීම / දේව වචනය කියවීම

* කෑම / බීම / ඇඳුම් ආදී පෞද්ගලික අවශ්‍යතා තමාට හැකි ලෙස සපයා දීම

* ආදරය, කරුණාව, සාමය, ඉවසීම වැනි ගුණාංග සමාජගත කිරීම

* යාච්ඤාව තුළ ශක්තිමත්ව සිටීමේ වැදගත්කම් හා ආදර්ශය ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

(ල. 2 + 3 + 5 = 10)

(5) (i) පව්කරුවන් සහමුලින්ම ප්‍රතික්ෂේප කළ යුතුය යන ආකල්පය

(ii) * ස්වේච්ඡාවෙන් ම ජේසුස් වහන්සේගේ පාද පාමුල වැටීම.

* තම පාපය හඳුනා ගැනීම

* හඬමින් මනස්තාපවීම (පාපය ප්‍රකාශ කිරීම)

* තමා සතු වටිනාම දෙය කැපකිරීම

* කිසිම බාධාවක්ට නතු නොවීම

* ඇදහිල්ලෙන් යුතුව පාද සේදීම

* විලවුන් ආලේපකර පාද සිප ගැනීම

(iii) * පාපයේ භයානකකම වටහා ගැනීමට නිහතමානී වීම

* පාපය හඳුනා ගැනීම

* පාපය ප්‍රකාශ කිරීම

* පාපය පිළිබඳ මනස්තාපනය වීම

* නැවත පව් නොකිරීමට අධිෂ්ඨාන කර ගැනීම

* භක්තියෙන් යුක්තව සමා අයැදීම

* ඇදහිල්ලෙන් පව් සමාව අත්කර ගැනීම

(ල. 2 + 3 + 5 = 10)

(6) (i) දිය උදර රෝගියා / අතක් පණ නැති මිනිසා

(ii) යමෙකුට අයත් කොටළුවෙක් හෝ ගොනෙකු හෝ සබත් දින ළිදේ වැටුනොත් එවෙලේමඋෟ ගොඩට අදින්නේ නැද්ද?

හෝ

සබත් දින දී අප කළ යුත්තේ යහපත ද? නොහොත් අයහපත ද? ප්‍රාණයක් නැසීම ද? නොහොත් ගලවා ගැනීම ද? යන ප්‍රකාශවලින් 1 ක් ලියා ඇතිනම් ලකුණු දෙන්න.

(iii) * දේව වචනය වචනාර්ථයෙන් පමණක් නොව එහි හරයඅවබෝධකර ගැනීම

* බාහිර පිළිවෙත් නොව අධ්‍යාත්මය නිවැරදි විය යුතුය.

* දේව රාජ්‍යයේ පණිවිඩයේ පදනම ප්‍රේමය බව

* නිහතමානී යටහත්පහත්කම ජීවිතයෙන් නිරතුරුව ප්‍රකාශවීම
* දෙවියන් වහන්සේටත් ලෞකික වස්තුවටත් එකවර සේවය කළ නොහැකි බව.
* දේව රාජ්‍යන්ගේ වටිනාකම් අප තුළ ගොඩ නංවාගත යුතුය.

(ල. 2 + 3 + 5 = 10)

(7) කෙටි සටහන්

(i) **දිවැසි කාර්ය**

දේවාත්මානු භාවයෙන් එළිදරව්වන දේව පණිවිඩය ජනතාවට පිළිගත්වන්නා දිවැසිවරයායා. ජනතාව දෙවියන් හන්සේට සමීප කරයි. දිවැසි කාර්යයට දෙවියන් වහන්සේගෙන් කැඳවීම ලැබ ආලේප කරයි. දිවැරසිවරු නම් කර තිබී. අපගේ දිවැසිවර සේවය ආදී සිසුන් ලියා ඇති කරුණුවලට ලකුණු දෙන්න.

(ii) **දේව සැලැස්මට අවනත වීම**

දේව පුත්‍රයා පවා දේව සැලැස්මට අවනතවූ බව. දේව සැලැස්මට අවනත වූවෝ - මරියා, ජෝසෙප් සෙකරියස්, එලිසෙබෙත්, එඬේරු (නව ගිවිසුමේ චරිත) පැරණි ගිවිසුමේ ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් / ජෝසෙප් මෝසෙස් ආදී ලියා ඇති කරුණු. අපද දේව සැලැස්මට අවනත වීමේ අවශ්‍යතාවය. ආදී ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

(iii) **ස්නාවක ජොහාන්ගේ පෙරමග දූත සේවය**

ජේසුස් වහන්සේ මෙසියෙස් වහන්සේ ලෙසට පිළිගැනීමට අවශ්‍ය පසුබිම සූදානම් කිරීම, පව්කමා කිරීමේ බව්තීස්මය, ජලයෙන් ලබාදීම, අභියෝගාත්මක දේශනා, ආදී කරුණු පිළිබඳ ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(iv) **පේදුරුගේ ශ්‍රාවකත්වය**

ප්‍රධාන ගෝලයාව සිට ජේසුස් වහන්සේ නිසි ලෙස හඳුනා ගැනීම. සාක්ෂි දැරීම,. ජේසුස් වහන්සේ නාඳුනන බව ප්‍රකාශ කිරීම. සිත් හැරීම. සේවය කිරීම ආදී කරුණු ඉදිරිපත් කර ඇති ආකාරයට අනුව ලකුණු ලබාදීම.

(ල. 5 + 5 = 10)